# අහිංසක බිම්මල



වයි.එම් හිමාෂා දෙව්මිණී රාජකරුණා

කෘතියේ නම- අහිංසක බිම්මල
කතෘගේ නම- වයි.එම් හිමාෂා දෙව්මිණි රාජකරුණා

කතෘගේ වෙනත් කෘති;

-අපේ පුංචි කුරුල්ලා 2020 වර්ෂය
-අහිංසක මුව පැටියා 2021 වර්ෂය
-මම හොඳ දරුවෙක් වෙමි 2022 වර්ෂය

ISBN - 978-624-206-608-0
Bar Code - 9 786242 066080

# පිදුම

ගුණ නුවණ ගැන,
නිබඳ නිරතුරු
දැනුම ලබාදුන්
ගුරුතුමියට පුදමි...


## පෙරවදන

වත්මත් අධ්‍යාපජ්තයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පත්ත දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් පිටි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජ්ජයෙන් උරුමකරගත් මහාමායා දියණියත් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .එකී ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය වර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ථ දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවත් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහිත දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනත විද්‍යුත්පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණුඅත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුහවතුත් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුහවතුන් මෙන්ම තත් අයුරුන් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමයි.ශෂිකලා සේනාධිර විදුහල්පතිනිය මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර 2023.11.01

වටින් පිටින් කාක්කන්ගේ හඬ ඇහුණා
කුක්කු.......කු.......කු  කුකූළු හාමි හැඬලුවා.
ඉර පායා තණ කොළ ගොල්ලේ පිණි කැට
මුතු ඇට වගේ බැබලෙනවා.







රතු රෝස ගහේ මල් පිපිලා ,
බෝගන්විලා ගස් පාට පාට
මල් වලින් බර වෙලා, වතුසුදු
ගහ උඩ හරියට සුදු රෙද්දක්
එලුවා වගෙයි. ඉද්ද,
කටරොළු මල් ගස්
මනාලියෝ වගේ හරිම
ලස්සනයි.




ගස් වට කැරකෙමින් මී මැස්සා සිංදු කියනවා, සමනලයා නටනවා, හරිම සතුටුයි මගුල් ගෙයක් වගෙයි. මල් වත්ත කෙලවරේ ලී කොටයක් උඩ අහිංසක බිම්මලක් පිපුණා.රෝස, බෝගන්විලා, වතුසුදු මල් බිම්මල දිහා බලන්නවත් කැමති වුණේ නෑ.








අපෝ..........
බිම්මලත් මලක්ද?
කෝ අපට වගේ
ලස්සන මල්
පෙති? සුවඳ
රේණු? ඒ අය
ඇහුවා.





ලස්සන, සුවඳ නැති බිම්මලට අපිත් ආස නෑ. සමනලයයි, මීමැස්සයි  කීවා. බිම්මලට හරිම දුක හිතුණා. බිම්මල හරිම අහිංසක විදියට බිම බලාගෙන ඇඬුවා.




ඔන්න ටික වේලාවකට පසු එක පාරටම
වට පිටාව කළුවර වුණා.  වැහි වළාකුළු මතු
වුණා. වැහි වළාකුළුවලට ඉර  මුවා වුණා.
ගස් අතු ඇඹරෙමින් සුළඟ තදින් හැමුවා.


සිරි......සිරි  ගා පොද
වැටුණා. ටික වේලාවකට
පසු පොද වැස්ස
මහවැස්සක් වුණා.



තද සුළඟට, රෝස මල්වල පෙති හැලුණා. ඉද්ද මල් ඔක්කොම ගහ යටට වැටිලා මඩ වතුරේ පාවෙලා ගියා.



සිංදු කිය කියා නටමින් සිටි සමනලයයි,මී මැස්සයි මහ වැස්සට අහුවුණා. අත්තටු තෙමුණා. දැන් ඉතින් නටන්න තියා පියාඹන්නවත් බෑ....... පිහාටු හොඳටම තෙමිලා.





අත්තටු තෙමී අසරණ
වුණ මී මැස්සත්,
සමනලයත් ගැන
බිම්මලට හරියට දුක
හිතුණා. එන්න මගේ
හෙවන යටට එතකොට
තෙමෙන්නෙ නෑ. බිම්මල
ඒ දෙන්නට කතා කළා.



ඇත්තමයි බිම්මල හරි ම අගේ ඇති මලක් නේ? හරියට කුඩයක් වාගෙයි. සමනලයයි, මීමැස්සයි ඉක්මනටම බිම්මල යටට ගියා. ස්තූති යාළුවේ......... අපිට උදව් කළාට අපෙන් වුන වරදට අපට සමාවෙන්න. ඒකට කමක් නෑ අපි හැමෝම යාළුවෝනෙ..........

## පසු වදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත් පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින්, රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම, වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින්, අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම හුන්ථ ප්‍රණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සමපාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම පුදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මන් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම වනපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් පුජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල වේදිකාවට පිවිසී. ගත්කතු අංකුර සබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි. පසුමුමෙයටසෙනෙවිරත්න මහලේකම්පාසල් දරුවන් ගුන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01



# නිමි.